

# 2023

## වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## ANNUAL REPORT

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

சுகததாச தேசிய விளையாட்டுத் தொகுதி அதிகார சபை

**Sugathadasa National Sports Complex Authority**

# 2 0 2 3

# වාර්ෂික වාර්තාව




**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

1999 අංක 17 දරන පාර්ලිමේන්තු පනත හා
2017 අංක 14 දරන (සංශෝධන) පනත මඟින් නීතිගත කර ඇත.

© සියලු හිමිකම් ඇවිරිණි

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**වාර්ෂික වාර්තාව - 2023**

**ප්‍රකාශනය**
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ.2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 0112 384 385 / 0112 445 677
ෆැක්ස් : 0112 44 56 75
විද්‍යුත් තැපැල් : asnsca@gmail.com

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එෂ්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම - 0112 815 816

# පටුන


| | | | |
|---|---|---|---|
| 1. | හැඳින්වීම | - | 5 |
| 2. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කළමනාකාරිත්ව මණ්ඩලය | - | 6-7 |
| 3. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව | - | 7-8 |
| 4. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් | - | 8-9 |
| 5. | අපගේ දර්ශනය සහ මෙහෙවර | - | 10 |
| 6. | ආයතනයේ සංවිධාන ව්‍යුහය | - | 11 |
| 7. | අනුමත කාර්ය මණ්ඩලය | - | 12-14 |
| 8. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ අරමුණු | - | 14 |
| 9. | අධිකාරියේ වගකීම් හා කාර්යයන් | - | 14-15 |
| 10. | පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර | - | 15 |
| 11. | මානව සම්පත් සංවර්ධනය | - | 16-17 |
| 12. | කළමනාකාරිත්ව වාර්තාකරණය | - | 17 |
| 13. | කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් | - | 17 |
| 14. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය | - | 17-18 |
| 15. | භාණ්ඩ සමීක්ෂණය | - | 18 |
| 16. | වාර්ෂික ප්‍රසම්පාදනය | - | 18 |
| 17. | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය | - | 18 |
| 18. | ගෘහස්ථ ක්‍රීඩාගාරය | - | 19-20 |
| 19. | උප ක්‍රීඩාගාරය | - | 20 |
| 20. | පිහිණුම් තටාක සංකීර්ණය | - | 20-21 |
| 21. | කායවර්ධන මධ්‍යස්ථානය | - | 21 |
| 22. | ක්‍රීඩා හෝටලය | - | 21 |
| 23. | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය | - | 22 |
| 24. | අනුබද්ධ ආයතන හා ක්‍රීඩාංගණ පරිශ්‍ර | - | 23 |
| 25. | බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය | - | 23 |
| 26. | නුවරඑළිය තුරඟ තරඟ පිටිය | - | 23 |
| 27. | බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක | - | 24 |
| 28. | ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය | - | 24-25 |
| 29. | සු. ජා.ක්‍රී.සං.අ ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය | - | 25 |
| 30. | 2024 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති | - | 25-26 |
| 31. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | | 26-33 |
| 32. | මූල්‍ය ප්‍රකාශය | - | 34 |
| 33. | අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | - | 34-35 |
| 34. | ආදායම් වියදම් ප්‍රකාශය | | 36 |
| 35. | ශේෂ පත්‍රය | - | 37 |
| 36. | ක්‍රීඩාංගණ අනුව ආදායම | - | 38 |
| 37. | ආයතනයේ සමස්ත ප්‍රගතිය | - | 39 |
| 38. | ආයතනයේ මුළු ණය | - | 39 |
| 39. | විගණකාධිපති වාර්තාව | - | 40-46 |
| 40. | විගණකාධිපති වාර්තාව සඳහා යාවත්කාලීන තොරතුරු | - | 47-64 |


SUGATHADASA INDOOR STADIUM





## හැඳින්වීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වෙනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත් කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනතින් 1999.09.01 දින සිට බලපාන සේ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.

කාලීන අවශ්‍යතාව මත කළමනාකාරිත්ව මණ්ඩල උපදෙස් හා අනුමැතියට අනුව ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති සංශෝධනය කර 2017 අගෝස්තු මස 28 දින පාර්ලිමේන්තුවේ සභා සම්මත කරන ලද 2017 අංක 14 දරන (සංශෝධන) පනතද මීට අදාළ වේ.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු සඳහා එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත කළමනාකාරිත්ව මණ්ඩලයක් මඟින් සිදු කරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
- ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ක්‍රීඩා පනත යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්.
- භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු ඇතුළුව,
- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ 08 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරනු ලැබේ.



## කළමනාකාරිත්ව මණ්ඩලය
2023-01-01 සිට 2023-02-01 දින දක්වා

| | | | |
|---|---|---|---|
| 1. | රසිත් තාලින්ද වික්‍රමසිංහ මහතා | - | සභාපති |
| 2. | ආචාර්ය ජයලත් ඉලංගකෝන් මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| 3. | ඒ ජේ එස් එස් එදිරිසූරිය මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 4. | බී ඒ ගාමිණී වික්‍රමපාල මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) | - | සාමාජික |
| 5. | ඉනෝකා ලංකාතිලක මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය) | - | සාමාජික |
| 6. | එස් සී ඩබ්ලිව් ජයවීර මහතා | - | සාමාජික |
| 7. | ඒ සජිත් කුමාර මහතා | - | සාමාජික |
| 8. | මහේෂ් කොටුවැල්ල මහතා | - | සාමාජික |
| 9. | ආර් පී කුකුලේවිතාන මහතා | - | සාමාජික |
| 10. | ආචාර්ය ඩබ්ලිව් එම් ඒ එම් ජයවර්ධන මහතා | - | සාමාජික |
| | එච් කේ එම් කෙවින් රාජිත මහතා | - | ලේකම් |

## කළමනාකාරිත්ව මණ්ඩලය
2023-06-15 සිට 2023-12-12 දින දක්වා

| | | | |
|---|---|---|---|
| 1. | මේජර් ජනරාල් ලාල් චන්ද්‍රසිරි | - | සභාපති |
| 2. | ආචාර්ය ජයලත් ඉලංගකෝන් මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| 3. | අනුර මුතුමාල මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 4. | ඒ ජේ එස් එස් එදිරිසූරිය මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 5. | බී ඒ ගාමිණී වික්‍රමපාල මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය) | - | සාමාජික |
| 6. | ඉනෝකා ලංකාතිලක මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය) | - | සාමාජික |
| 7. | එල් පී වී ඊ ලියනගේ මහතා | - | සාමාජික |
| 8. | ඩී එම් එස් පී දිසානායක මහතා | - | සාමාජික |
| 9. | මහේෂ් කොටුවැල්ල මහතා | - | සාමාජික |
| 10. | සී ඒ ඩී ඉන්ද්‍රජිත් කොලොන්නෙ මහතා | - | සාමාජික |
| | මහිලිනි මයුරන් මිය | - | ලේකම් |

## කළමනාකාරිත්ව මණ්ඩලය
2023-12-12 සිට 2023-12-31 දින දක්වා

| | | | |
|---|---|---|---|
| 1. | උදාර රත්නායක මහතා | - | සභාපති |
| 2. | ආචාර්ය ජයලත් ඉලංගකෝන් මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| 3. | ආචාර්ය ශෙමාල් ප්‍රනාන්දු<br>(අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 4. | බී ඒ ගාමිණී වික්‍රමපාල මහතා<br>(අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය) | - | සාමාජික |
| 5. | ඉනෝකා ලංකාතිලක මිය<br>(නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය) | - | සාමාජික |
| 6. | රවීන් ප්‍රනාන්දු මහතා | - | සාමාජික |
| 7. | ආචාර්ය ඩී මලික ගුණසේකර | - | සාමාජික |
| 8. | ආචාර්ය පී ඒ ක්‍රිශාන්ත පතිරාජ මහතා | - | සාමාජික |
| 9. | දුලාන් ආසිරි හෙට්ටිආරච්චි මහතා | - | සාමාජික |
| 10. | යූ එච් ලක්මල් උඩකන්ද මහතා | - | සාමාජික |
| 11. | එල් ආර් සහබන්දු වීරසිංහ මහතා | - | සාමාජික |
| | ශගීත් සෝමරත්න මහතා | - | ලේකම් |

## විගණන හා කළමනාකරණ කමිටුව
2023-01-01 සිට 2023-07-15 දින දක්වා

| | | | |
|---|---|---|---|
| 1. | ඉනෝකා ලංකාතිලක මිය<br>(නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය) | - | සභාපති |
| 2. | බී ඒ ගාමිණී වික්‍රමපාල මහතා<br>(අධ්‍යක්ෂ ජනරාල්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) | - | සාමාජික |
| 3. | ඒ ජේ එස් එස් එදිරිසූරිය මහතා<br>(අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 4. | ආචාර්ය ඩබ් එම් ඒ එම් ජයවර්ධන මහතා | - | සාමාජික |
| 5. | ආර් පී කුකුලේවිතාන මහතා | - | සාමාජික |
| 6. | ඩී එච් කලන්සූරිය මිය<br>(ප්‍රධාන අභ්‍යන්තර විගණක, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය) | - | නිරීක්ෂණ මට්ටම සහභාගිත්වය |
| 7. | බී එල් ඩී බාලසූරිය මිය<br>(විගණන අධිකාරී, ජාතික විගණක කාර්යාලය) | - | නිරීක්ෂණ මට්ටම සහභාගිත්වය |
| 8. | නිරෝෂා ගම්ගොඩගේ මිය<br>(සහකාර විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය) | - | නිරීක්ෂණ මට්ටම සහභාගිත්වය |

## විගණන හා කළමනාකරණ කමිටුව
2023-07-15 සිට 2023-12-31 දින දක්වා

| | | | |
|---|---|---|---|
| 1. | ඉනෝකා ලංකාතිලක මිය<br>(නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය) | - | සභාපති |
| 2. | බී ඒ ගාමිණී වික්‍රමපාල මහතා<br>(අධ්‍යක්ෂ ජනරාල්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) | - | සාමාජික |
| 3. | ආචාර්ය ශෙමාල් ප්‍රනාන්දු<br>(අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | සාමාජික |
| 4. | ආචාර්ය ඩබ් එම් ඒ එම් ජයවර්ධන මහතා | - | සාමාජික |
| 5. | ඩී එම් එස් පී දිසානායක මහතා | - | සාමාජික |
| 6. | ඩී එච් කලන්සූරිය මිය<br>(ප්‍රධාන අභ්‍යන්තර විගණක, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | - | නිරීක්ෂණ මට්ටමේ සහභාගිත්වය |
| 7. | බී එල් ඩී බාලසූරිය මිය<br>(විගණන අධිකාරි, ජාතික විගණක කාර්යාලය) | - | නිරීක්ෂණ මට්ටමේ සහභාගිත්වය |
| 8. | නිරෝෂා ගම්ගොඩගේ  මිය<br>(සහකාර විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය) | - | නිරීක්ෂණ මට්ටමේ සහභාගිත්වය |

## සු.ජා.ක්‍රී.සං අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන්
2023.01.01 - 2023.12.31 දින දක්වා

| | | | |
|---|---|---|---|
| • | එස් එස් කේ ගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ  (වැඩ තහනම් කර ඇත) |
| • | බුද්ධික වෙහෙරගොඩ මහතා | - | අධ්‍යක්ෂ වැ. බ. |
| • | මුදිතා විදානආරච්චි මිය | - | සහකාර අධ්‍යක්ෂ (පාලන)<br>(2023.06.01 දින සිට) |
| • | එච් අනෝජා ප්‍රියදර්ශනී මිය | - | සහකාර අධ්‍යක්ෂ (පාලන) වැ.බ./ පරිපාලන නිලධාරි<br>(2023.03.16 සිට 2023.04.30) |
| • | දීප්තිකා අබේකෝන් මිය | - | පරිපාලන නිලධාරි වැ.බ.<br>(2023.05.01 සිට 2023.06.01) |
| • | ඩබ්ලිව් කේ ඒ ගයානි සී විතාන මිය | - | පරිපාලන නිලධාරි  (2023.06.01 දින සිට) |
| • | ඩබ් එම් පී එස් බණ්ඩාර පියදාස මහතා | - | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)<br>(2023.07.14 දින දක්වා) |
| • | එම් එන් දිසානායක මෙනවිය | - | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) වැ.බ.<br>(2023.08.03 සිට 2023.12.14) |

| | | | |
|---|---|---|---|
| • | සාගරිකා යටිගල මිය | - | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)<br>(2023.12.14 දින සිට) |
| • | ඩබ් එම් වයි ඒ විජේසූරිය මිය | - | සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) |
| • | එච් කේ එම් කේ රාජිත මහතා | - | නීති නිලධාරි (2023.06.22 දින දක්වා) |
| • | එච් ශගීත් ප්‍රබෝධ සෝමරත්න මහතා | - | නීති නිලධාරි (2023.11.29 දින සිට) |
| • | කේ බන්දුතිලක මහතා | - | තොරතුරු තාක්ෂණ නිලධාරි |
| • | අයි ඩබ්ලිව් එම් සී ආර් ඉලංගකෝන් මහතා | - | ක්‍රීඩාංගණ කළමනාකරු (ගෘහස්ථ)<br>වැ. බ.<br>(2023.03.22 දින සිට 2023.12.08 දක්වා) |
| • | පී ඩී එන් ප්‍රභා කිරිඇල්ල මිය | - | ක්‍රීඩාංගණ කළමනාකරු (එළිමහන්) |
| • | පී ඩී සම්පත් පෙරේරා මහතා | - | ක්‍රීඩාංගණ කළමනාකරු (වෙන්කිරීම්) |
| • | එස් සී වික්‍රමසූරිය මහතා | - | ක්‍රීඩාංගණ කළමනාකරු (ගෘහස්ථ)<br>(2023.12.08 දින සිට) |
| • | ඩී එම් කේ මානෙල් දිසානායක මිය | - | ක්‍රීඩාංගණ කළමනාකරු<br>(බෝගම්බර) වැ.බ.<br>(2023.12.01 දින සිට) |
| • | එස් කේ ඩී ශානිකා ප්‍රභාෂ්වරී මිය | - | මිලදීගැනීම් / අලෙවි නිලධාරි |
| • | එම් එන් දිසානායක මෙනවිය | - | ගිණුම් නිලධාරී |
| • | එල් එල් චමින්ද මහතා | - | ආරක්ෂක කළමනාකරු |
| • | එම් එන් කේ ගුණතිලක මහතා | - | නඩත්තු නිළධාරි |



# අපගේ දර්ශනය හා මෙහෙවර

## දැක්ම

ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත
ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත් කිරීම සහ
එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුළින්
ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබා දීම.

---

## මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මඟින්
ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ
ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට අවැසි
පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.

---

# ආයතනයේ සංවිධාන ව්‍යුහය



# අනුමත කාර්ය මණ්ඩලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ආයතනයේ සේවා අවශ්‍යතාව මත අනුමත කාර්ය මණ්ඩල තොරතුරුවලට අනුව අනුමත කාර්ය මණ්ඩලය 378ක් වන අතර එක් තනතුරක් කොන්ත්‍රාත් පදනම මත අනුමත කර ඇත. මින් 2023.12.31 දිනට සේවයේ යෙදී සිටින ස්ථිර සේවක සංඛ්‍යාව 266 ක් වේ. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සේවක සංඛ්‍යාව 70.37%ක් පමණ වන අතර, එය පහත පරිදි දැක්විය හැකිය.

| තනතුර | වැටුප් කාණ්ඩය | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව | 2023.12.31 දිනට සේවක සංඛ්‍යාව | 2023.12.31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| සභාපති | | | | | | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | | | | | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරු** | | | | | | |
| අධ්‍යක්ෂ | HM 1-1 | 1 | - | 1 | - | 0 |
| **මධ්‍යම මට්ටමේ කළමනාකරු** | | | | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (විදුලි/කාර්මික) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| නීති නිලධාරි | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තො.තා/මාධ්‍ය) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (සැලැසුම්) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| භූමි පාලක උපදේශක | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| අභ්‍යන්තර විගණක | MM 1-1 | 1 | - | 1 | - | 0 |
| **කනිෂ්ඨ කළමනාකරු** | | | | | | |
| සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් | JM 1-1 | 0 | 1 | - | 0 | 1 |
| පරිපාලන නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ගිණුම් නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| නඩත්තු නිලධාරී | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| මිලදී ගැනීමේ නිලධාරී/ අලෙවි නිලධාරී | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ප්‍රසම්පාදන නිලධාරී | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| ආරක්ෂක කළමනාකරු | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ) | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (එළිමහන්) | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (බෝගම්බර) | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (බෙලිඅත්ත) | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | | | | |
| තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-1 | 1 | - | 1 | - | 0 |
| තාක්ෂණික සහකාර (විදුලි) | MA 2-1 | 3 | - | 0 | - | 3 |
| ගබඩා භාරකරු | MA 2-1 | 3 | - | 0 | - | 3 |
| පොත් තබන්නා | MA 2-1 | 1 | - | 1 | - | 0 |
| තාක්ෂණික සහකාර (කාර්මික/මෝටර්) | MA 2-1 | 1 | - | 0 | - | 1 |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA 2-1 | 2 | - | 0 | - | 2 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | | | | |
| කළමනාකරණ සහකාර | MA 1-1 | 32 | - | 21 | - | 11 |
| භූමි පාලක | MA 1-1 | 1 | - | 1 | - | 0 |
| වැඩ පරීක්ෂක | MA 1-1 | 2 | - | 1 | - | 1 |
| ක්‍රීඩා නිලධාරී | MA 1-1 | 8 | - | 4 | - | 4 |
| ක්‍රීඩා පුහුණුකරු ★★ | MA 1-1 | 1 | - | 1 | - | 0 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | MA 1-1 | 2 | - | 1 | - | 0 |
| ආරක්ෂක නිලධාරී | MA 1-1 | 16 | - | 17 | - | -1 |
| උද්‍යාන අලංකරණ සහකාර | MA 1-2 | 1 | - | 0 | - | 1 |
| **ප්‍රාථමික ශිල්පීය** | | | | | | |
| විදුලි කාර්මික ★★ | PL 3 | 1 | - | 1 | - | 0 |
| | PL 3 | 4 | - | 0 | - | 4 |
| රියදුරු | PL 3 | 10 | - | 6 | - | 4 |
| **ප්‍රාථමික අර්ධ ශිල්පීය** | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වඩු කාර්මික | PL 2 | 3 | - | 2 | - | 1 |
| පෙදරේරු | | 3 | - | 3 | - | 0 |
| වෑද්දුම්කරු | | 3 | - | 2 | - | 0 |
| පින්තාරු | | 3 | - | 2 | - | 1 |
| පෑස්සුම්කරු | | 3 | - | 1 | - | 0 |
| බයිසිකල් පණිවිඩකරු | | 2 | - | 1 | - | 1 |
| ජීවිතාරක්ෂක සහායක | | 4 | - | 0 | - | 4 |
| සම්භාහක | | 2 | - | 0 | - | 2 |
| අරක්කැමි | | 1 | - | 0 | - | 1 |
| **ප්‍රාථමික ශිල්පීය නො වන** | | | | | | |
| ක්‍රීඩාංගණ සහායක | PL 1 | 111 | - | 84 | - | 27 |
| ආරක්ෂක නියාමක | | 100 | - | 75 | - | 0 |
| කාර්යාල කාර්ය සහායක | | 10 | - | 8 | - | 2 |
| පිහිනුම් තටාක සහායක | | 5 | - | 0 | - | 5 |
| බංගලා භාරකරු | | 1 | - | 0 | - | 1 |
| ක්‍රීඩාංගණ ලිපිකරු ★★ | | 15 | - | 12 | - | 0 |
| | | 377 | 1 | 260 | 0 | 86 |

(★★) තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන ලෙස තනතුර අනුමත කිරීමේ දී බඳවාගැනීමේ පරිපාටියේ සුදුසුකම් අනුමත කර ඇත.

**අධිකාරියේ අරමුණු**



- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම.
- ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු හා පහසුකම් වැඩි දියුණු කිරීම.
- රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේ පවතින පහසුකම් සැපයීම.
- සමාජ ඒකාබද්ධතාවට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදාගනු ලැබීම සහතික කිරීම.

**අධිකාරියේ වගකීම් සහ කාර්යයන්**

**වගකීම්**



- කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සියලු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.
- ගොඩනැගිලිවලට හා ව්‍යුහයවලට අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් හෝ වෙනස් කිරීම් හෝ සිදු කිරීම.

- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කර ගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩිදියුණු කරගැනීමට හැකි වනසේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසියවලට යටත්ව පහසුකම් ලබාදීම.
- විශේෂයෙන්ම ග්‍රාමීය ක්‍රීඩා අංශ වැඩි දියුණු කිරීමේ අරමුණ ඇති ව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වා ගෙන යාම.
- ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් ව ලබාදීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.
- අප අධිකාරියේ පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

**කාර්යයන්**



- ඉහත වගකීම් ඉටු කිරීමට අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.
- ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේ දී මෙන්ම රාත්‍රී කාලයේ දී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිඳුම් තටාකාංගන පහසුකම් සැපයීම.
- විභාග, සම්මන්ත්‍රණ, සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

**පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සේවාලාභීන්ගේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි ක්‍රීඩා පහසුකම් ලබාදීමට කටයුතු කරන අතර, පුළුල් ක්ෂේත්‍රයක සේවා පහසුකම් ලබාදීමට ක්‍රීඩාංගණ හා ක්‍රීඩාගාර අවශ්‍ය පරිදි සකසාදීමට කටයුතු කරනු ලැබේ.

ගෘහස්ථ ක්‍රීඩාංගණය, එළිමහන් ක්‍රීඩාංගණය හා බෝගම්බර ක්‍රීඩාංගණයන්හි ක්‍රීඩා පිටිවල පවත්වනු ලබන ක්‍රීඩා ඉසවු මෙන් ම සෙසු වැඩසටහන් පැවැත්වීම සඳහා දිවා කාලයේ මෙන් ම රාත්‍රී කාලයේ දී ද සේවා පහසුකම් උසස් ප්‍රමිතියකින් ලබාදීමට සැලසුම් කර ඇත. පාසැල් මට්ටමේ සිට දිස්ත්‍රික් තරඟ, පළාත් මට්ටමේ තරඟ නියෝජනය කරමින් ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා ඉසවුවලින් ජාත්‍යන්තර තලය දක්වා යාමට අවශ්‍ය සේවා සහ පහසුකම් සකසා ඇති එක ම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

**ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩා**

මලල ක්‍රීඩා, රගර්පාපන්දු, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, බැඩ්මින්ටන්, මේසපන්දු, ජූඩෝ, මල්ලවපොර, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික්, පිහිණුම් ක්‍රීඩා වශයෙන් ක්‍රීඩා පැවැත්වීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

**සෞඛ්‍යය හා අධ්‍යාපනය**

ආගමික වැඩසටහන්, ජාතික හා ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පිහිණුම් පාසල හා පුහුණු පාඨමාලා, ජීවිතාරක්ෂක පාඨමාලා, කායවර්ධන පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.

**විනෝදාස්වාදය**

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංගීත සංදර්ශන, ප්‍රාසංගික වැඩසටහන් පැවැත්වීම හා වාර්ෂික සුහද හමු පැවත්වීම සඳහා උසස් මට්ටමේ සේවා හා පහසුකම් සැපයීම.

**වෙළෙඳ ප්‍රචාරණ හා දැන්වීම්**

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මඟින් සේවා පහසුකම් සැපයීම. ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගිත්වයෙන් වෙළෙඳ දැන්වීම් ක්‍රීඩාංගණ පරිශ්‍රයේ රූගත කිරීම.

සිනමාකරුවන් විසින් ද ඔවුන්ගේ ක්‍රීඩාව සම්බන්ධ නිර්මාණවලදී ක්‍රීඩාංගණ පරිශ්‍රයේ පසුතලය යොදාගැනීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීම සිදු කරයි.

ප්‍රධාන මාර්ගයට මුහුණලා ඩිජිටල් තාක්ෂණයෙන් යුත් අඩි 20 x 20 ප්‍රමාණයෙන් යුත් LED දැන්වීම් පුවරුවක් එළිමහන් ක්‍රීඩාංගණයේ ස්ථාපනය කර ඇත.

ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත අනුබද්ධ ආයතන වලින් සමන්විත වේ.

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පිහිණුම් තටාක සංකීර්ණය
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය
4. ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
6. බෙලිඅත්ත පිහිණුම් තටාකය
7. නුවරඑළිය තුරඟ තරඟ පිටිය

**මානව සම්පත් සංවර්ධනය**

2023 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද වර්ෂයකි. එම වර්ෂය තුළ පහත සදහන් විෂය ක්ෂේත්‍රයන්ට අනුකූලව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ලබා දීමට කළමනාකාරිත්වය කටයුතු කර ඇත.



| වැඩසටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව | කාලසීමාව | සමස්ත ආයෝජනය (රු. .00) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන | 50 | 2023.09.12 | 25,000.00 | - | දේශීය |
| ජාතික කම්කරු අධ්‍යයන ආයතනය මගින් මෙහෙයවූ පුහුණු වැඩසටහන (කාර්යාල නිවාඩු භාර නිලධාරී වගකීම්) | 01 | 2023.09.07 | 5,000.00 | - | දේශීය |
| ජාතික කම්කරු අධ්‍යයන ආයතනය මගින් මෙහෙයවූ පුහුණු වැඩසටහන(විගණන විමසුම් පිළිබඳව) | 01 | 2023.09.07 | 15,000.00 | - | දේශීය |
| ජාතික කම්කරු අධ්‍යයන ආයතනය මගින් මෙහෙයවූ පුහුණු වැඩසටහන (රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධ) | 01 | 2023.09.12 | 5,000.00 | - | දේශීය |
| සන්නිවේදන හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන | 01 | 2023.09.12 | 61,141.79 | - | දේශීය |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාව | 04 | 2023.09.26 - 2023.11.28 | 100,000.00 | - | දේශීය |
| කාර්ය මණ්ඩල වැටුප් විෂමතාව පිළිබඳව මෙහෙයවූ වැඩසටහන | 10 | 2023.10.27 | 10,000.00 | - | දේශීය |
| | | | **221,141.79** | | |

**කළමනාකාරීත්ව වාර්තාකරණය**

ආයතනික මාසික ප්‍රගතිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම අඛණ්ඩ ව මාසික ව සිදු කරන අතර, තුන් වන කාර්තුව අවසානයේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන කාර්යසාධන වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කිරීමටත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන ආයතන වෙත සංඛ්‍යාංක දත්ත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත.

**කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම්**

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදු කරන අතර, ඊට අදාළ රැස්වීම් මාසික ව පැවැත්වේ. 2023 වර්ෂයට අදාළව කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇත.

**අධිකාරියේ විගණන කාර්යය**

2023 විගණිත වර්ෂය සඳහා විගණන විමසුම් 10 ක් ඉදිරිපත් වී ඇති අතර, විගණන කමිටුව එම

වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව,

- අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2023 වර්ෂයට අදාළ පිළිතුරු ලබා දී ඇති අතර, ඒවා ක්‍රියාවට ද ලක් කර ඇත.
- ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් සඳහා මෙම අධිකාරියේ ඊට අදාළ නිලධාරීන් සහභාගී වී ඇත.

**භාණ්ඩ සමීක්ෂණය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා 2023.12.14 දින අනුකමිටු 15කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත් කරන ලදී. රජයේ මුදල් රෙගුලාසි 756 හා 757 විධිවිධාන අනුව සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

**වාර්ෂික ප්‍රසම්පාදනය**

2023 මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා ගෘහස්ථ ක්‍රීඩාංගණය, වැලිමහන් ක්‍රීඩාංගණය, බෝගම්බර ක්‍රීඩාංගණය හා බෙලිඅත්ත ක්‍රීඩාංගණය මෙන්ම නුවරඑළිය තුරඟ තරඟ ක්‍රීඩාංගණ වෙනුවෙන් සැලසුම් / සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු පහත පරිදි වේ.

| අ.අ | ප්‍රසම්පාදනය | මුදල (රු) |
|---|---|---|
| 1 | වැලිමහන් ක්‍රීඩාංගනයේ 400m / 200m කෘත්‍රිම ධාවන පථය ප්‍රතිසංස්කරණය කිරීම. | 75,000,000.00 |
| 2 | වැලිමහන් ක්‍රීඩාංගණයේ පතිත විදුලි ආලෝක පද්ධතිය ප්‍රතිසං-ස්කරණය කිරීම. | 40,000,000.00 |
| 3 | පිහිනුම් තටාක පොම්පාගාරය අලුත්වැඩියා කිරීම. | 78,000,000.00 |
| 4 | CCTV කැමරා පද්ධතිය සහ මාධ්‍ය ඒකකය ස්ථාපනය කිරීම | 10,000,000.00 |
| 5 | ක්‍රීඩා බැංකු ව්‍යාපෘතිය. | 19,500,000.00 |
| 6 | ක්‍රීඩා හෝටල් මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීම. | 23,000,000.00 |
| 7 | ගෘහස්ථ ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | 15,000,000.00 |
| 8 | වැලිමහන් ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | 10,000,000.00 |
| 9 | බෝගම්බර ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම | 10,000,000.00 |
| 10 | අවිච්ඡේද ව්‍යාපෘති | 117,500,000.00 |
| | **මුළු මුදල (රු.)** | **398,000,000.00** |

**සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය**

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය පහත සඳහන් අංශ වලින් සමන්විත වේ.

1. උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
2. පිහිණුම් තටාක සංකීර්ණය
3. කායවර්ධන මධ්‍යස්ථානය
4. ක්‍රීඩා හෝටලය

**ගෘහස්ථ ක්‍රීඩාගාරය**





ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරඟ පැවැත්වීමට පහසුකම් සැකසී ඇත. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා වැඩමුළු පැවැත්වීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැති තරඟ ශූරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| අ.අ | ක්‍රියාකාරකම | තරඟ එකතුව |
|---|---|---|
| 1. | රැස්වීම් | 12 |
| 2. | ජාත්‍යන්තර/ දේශීය සංගීත සංදර්ශන | 07 |
| 3. | අත්පන්දු තරඟ | 04 |
| 4. | කරාතේ තරඟ | 20 |
| 5. | පැසිපන්දු තරඟ | 06 |
| 6. | ජිම්නාස්ටික් /ඒරෝබික් තරඟ | 06 |
| 7. | බැඩ්මින්ටන් තරඟ | 02 |
| 8. | දැල් පන්දු තරඟ | 05 |
| 9. | බොක්සින් තරඟ | 02 |
| 10. | අත්පන්දු පුහුණුවීම් | 04 |
| 11. | පැසිපන්දු පුහුණුවීම් | 49 |
| 12. | දැල් පන්දු පුහුණුවීම් | 22 |
| 13. | වීඩියෝ පටිගත කිරීම් | 01 |
| 14. | පෙරපාසල් උත්සව සඳහා වෙන්කිරීම | 01 |
| 15. | ක්‍රීඩා උපකරණ බාහිර පාර්ශව වෙත කුලියට ලබාදීම | 05 |
| 16. | වාණිජමය වෙළඳ කුටි හා වෙනත් | 56 |
| 17. | දැනුම මිණුම තරඟ | 01 |
| 18. | අනෙකුත් ඉසව් | 66 |
| | **එකතුව** | **269** |

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පවත්වන ක්‍රීඩා තරඟ හා වෙනත් උත්සව වලින් රු.99,528,785.00 වාර්ෂික මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.

**උප ක්‍රීඩාගාරය**

මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් ලබාදීමට සකසා ඇත.

**පිහිණුම් තටාක සංකීර්ණය**

ශ්‍රී ලංකාවේ පාසැල් මට්ටමේ හා ක්‍රීඩා සංගම් මගින් සැලසුම් කරනු ලබන පිහිණුම් පුහුණුවීම් කටයුතු මෙන්ම තරගාවලි පැවැත්වීම හා අධිකාරිය විසින් පාසැල් ළමුන් වෙනුවෙන් සහනදායි මිලකට සාමාජිකත්වය ලබා දී පිහිණුම් පාසැලක් ද පවත්වාගෙන යනු ලැබේ. මෙම පිහිණුම් සංකීර්ණය මඟින් පාසැල් පිහිණුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර, දිවා / රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුලුනු සහිත පහසුකම් සැකසී ඇති ශ්‍රී ලංකාවේ එකම පිහිණුම් තටාක සංකීර්ණය ලෙස හැඳින්විය හැකි ය.



ප්‍රධාන පිහිණුම් තටාකය
(දිග මීටර් 50 / පළල මීටර් 22 /
ගැඹුර මීටර් 02)



පුහුණුවීම් සඳහා
උප පිහිණුම් තටාකය



කිමිඳුම් තටාකය



ළමා පිහිණුම් තටාකය

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිණුම් තටාකයන්හි පැවැති තරඟ /ශූරතාවලි /පුහුණුවීම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| අ.අ | ක්‍රියාකාරකම | තරඟ එකතුව |
|---|---|---|
| 1. | පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 332 |
| 2. | වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 84 |
| 3. | පිහිණුම් කිමිඳුම් හා ජල පන්දු තරඟ | 25 |
| 4. | පුහුණුවීම් | 388 |
| 5. | වෙළඳ කුටි | 12 |
| | **එකතුව** | **841** |

ඉහත තරඟ / ශූරතාවලි / පුහුණුවීම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිණුම් තටාකාංගන වලින් රු.17,994,503.00 ක මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.

**කායවර්ධන මධ්‍යස්ථානය**

මෙම මධ්‍යස්ථානයේ පහසුකම් ලබාගැනීම සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන් ම සෙසු සේවා ලාභීන්ටද සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පුහුණුවීම්වල යෙදිය හැකිය. 159 දෙනෙකු මෙහි සාමාජිකත්වය ලබා ඇත.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු.4,110,850.00 ක මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.

**ක්‍රීඩා හෝටලය**

අධිකාරියේ සේවා පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත නේවාසික පහසුකම් ලබාදීම සඳහා ස්ථාපනය කර ඇති ක්‍රීඩා හෝටලය නවීකරණයෙන් පසු යාවත්කාලීන තොරතුරු පහත පරිදි වේ.

මෙම ක්‍රීඩා හෝටලය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය යටතේ ම පරිපාලනය කරනු ලබන අතර, මෙහි නේවාසික පහසුකම් සඳහා කාමර 42කින් යුක්ත දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ස්ථාපනය කර ඇත. මෙහි සාමාජික සාමාජිකාවන් 150කට අධික පිරිසකට එකවර නවාතැන් ගැනීමෙහි හැකියාව ඇත. මෙහි නවාතැන් පහසුකම් ලබා ගැනීමට අමතර ව උත්සව, ප්‍රියසාද පැවැත්වීම, රැස්වීම් හා වැඩමුළු පැවැත්වීම සඳහා ද පහසුකම් සලසා ඇත.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රීඩා හෝටල් සංකීර්ණයෙන් රු.27,733,892.00 ක මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.





**සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය**





ශ්‍රී ලාංකික පාසැල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් මලල ක්‍රීඩා තරඟ පැවැත්වීමට ජාත්‍යන්තර මට්ටමේ පහසුකම්වලින් සැකසී ඇති එක ම ක්‍රීඩාංගණය වේ. දිවා සහ රාත්‍රී කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ හා පාපන්දු / රග්බි පුහුණුවීම් හා තරඟ එකවර පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංග ණය සකසා ඇත. මෙම ක්‍රීඩාංගණයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරඹියහැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සැකසී ඇත.

එළිමහන් ක්‍රීඩාංගණයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මෙම කෘත්‍රිම ධාවන පථයවල පස් වන වතාවට නවීකරණ කටයුතු මෙම වර්ෂයේ දී අවසන් කරන ලදී. මීට අමතර ව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රී ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මලල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන් ම විවිධ උත්සව සඳහා ද පහසුකම් සපයනු ලැබේ.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරඟ හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අ.අ | ක්‍රියාකාරකම | තරඟ එකතුව |
|---|---|---|
| 1. | පාපන්දු තරඟ | 18 |
| 2. | මළල ක්‍රීඩා තරඟාවලි (මීටර් 400 ධාවන පථය) | 41 |
| 3. | මළල ක්‍රීඩා ඉසව් (මීටර් 400 ධාවන පථය) | 10 |
| 4. | ක්‍රීඩා උත්සව (මීටර් 400 ධාවන පථය) | 24 |
| 5. | රග්බි පුහුණුවීම් | 03 |
| 6. | ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය) | 73 |
| 7. | ව්‍යායාම සඳහා ඇවිදීමේ සාමාජිකත්ව | 59 |
| 8. | පුහුණුවීම් / පෙරහුරුව / ඉසව් | 08 |
| 9. | පැසි පන්දු පුහුණුවීම් | 84 |
| 10. | වෙරළ පන්දු පුහුණුවීම් | 07 |
| 11. | යෝග්‍යතා පරීක්ෂාව - ක්‍රිකට් | 19 |
| 12. | යෝග්‍යතා පරීක්ෂාව - පාපන්දු | 01 |
| 13. | මළල ක්‍රීඩා ලියාපදිංචි කිරීම (පාසල්) | 42 |
| | **එකතුව** | **389** |

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පැවැත් වූ තරඟ, උත්සව, "ඩී" රථගාල, බදු කුලී හා වෙනත් ප්‍රභව මඟින් රු.53,342,979.00 මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.

## අනුබද්ධ ආයතන හා ක්‍රීඩාංගණ පරිශ්‍ර

මෙම ක්‍රීඩාංගණය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 2001 වසරේ සිට මෙම අධිකාරිය වෙත භෞතික අයිතිය පැවරීමෙන් පසු පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ. මේ සඳහා ක්‍රීඩාංගණ කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය 70කට අධික පිරිසක් සේවයේ යොදවා ඇත.

මෙම එළිමහන් ක්‍රීඩාංගණය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරඟ නැරැඹියහැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මලල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගණය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණ ද මිලදී ගෙන ඇති අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන් ම සේවා ලාභීන්ට මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණයේ රථ ගාලෙන්, කායවර්ධන මධ්‍යස්ථානය මඟින් හා වෙනත් ලැබීම්වලින් රු. 24,172,028.00 ක මෙහෙයුම් ආදායමක් උපදවා ඇත.




| අ.අ | ක්‍රියාකාරකම | තරඟ එකතුව |
|---|---|---|
| 1. | පාපන්දු තරඟ | 01 |
| 2. | මළල ක්‍රීඩා තරඟාවලි (මීටර් 400 ධාවන පථය) | 08 |
| 3. | මළල ක්‍රීඩා ලියාපදිංචි වීම | 72 |
| 4. | මළල ක්‍රීඩා පුහුණු වීම | 345 |
| 5. | ක්‍රීඩා උත්සව (මීටර් 400 ධාවන පථය) | 41 |
| 6. | තේරීම් තරඟ / පුහුණුවීම් | 18 |
| 7. | රග්බි තරඟාවලි | 28 |
| 8. | රග්බි පුහුණුවීම් | 07 |
| 9. | රග්බි පුහුණු තරගාවලි | 166 |
| 10. | කායවර්ධන සාමාජිකත්වය | 196 |
| 11. | හුමාල තාපක භාවිතය (ස්ටීම් බාත්) | 112 |
| 12. | වෙනත් වැඩසටහන් | 12 |
| | **එකතුව** | 1006 |

## නුවරඑළිය තුරඟ තරඟ පිටිය

2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟතරඟ පිටියේ කළමනාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී.

භූමි ප්‍රමාණය හෙක්ටයාර 84ක් වූ මෙම තුරඟතරඟ පිටියෙන් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්වගාල්වලින්, බදුකුළී, අශ්ව / පෝනි ඇවිදීම වෙනුවෙන් ලද ආදායම, භූමිය කුලී පදනම මත ලබා දීම හා රථ වාහන නවතා තැබීමෙන් ලද ආදායම ලෙස රු. 6,511,500.00 මෙහෙයුම් ආදායමක් උපයා ගෙන ඇත.



නුවරඑළිය තුරඟතරඟ පිටිය හිටපු ජනපති රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් 2023-08-09 දින සිට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දෙන ලදී.

**බෙලිඅත්ත පිහිනුම් තටාක සංකීර්ණය**

මෙම පිහිනුම් තටාක සංකීර්ණය පහත අංගයවලින් සමන්විත වේ.

- මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිනුම් තටාකය
- කිමිදුම් තටාකය





බෙලිඅත්ත කාර්මික විදුහලේ පිහිනුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිනුම් තටාකවල අයිතිය සුගතදාස අධිකාරිය සතු නො වේ. අවට ප්‍රදේශයවල වැඩිහිටියන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිනුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

මෙම පිහිනුම් තටාකවල 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු මෙහෙයුම් ආදායම රු. 1,370,049.00 ක් වේ.

මෙම පිහිනුම් තටාක දෙක පිළිබඳ ව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත් කළ ද සහභාගීත්වය ඉතාමත් අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැකි ය.

**ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය**

ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත එක් ක්‍රීඩාංගණයකි. මෙහි එකවර ප්‍රේක්ෂකයින් 35,000කට පමණ තරඟ නැරඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින් ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගණය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත.



ඒ අනුව, 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණය මගින් රු. 2,902,174.00 ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක් ව පැවැති මෙම ක්‍රීඩාංග ණය දීර්ඝ කාලීන ව මාසික නොවෙනස් බදු කුලියක් සහිත ව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

**සු.ජා.ක්‍රී.සං.අ. ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023.12.31 දිනට**

| | කාර්යය | ඇස්තමේන්තුගත වටිනාකම (රු මිලි) | 2023 අවසන් කාර්තුව සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු මිලි) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | |
| 01 | එළිමහන් ක්‍රීඩාංගණයේ පතිත විදුලි ආලෝක පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම. | 40.0 | 40.0 | | 4% |
| 02 | පිහිනුම් තටාක පොම්පාගාරය අලුත්වැඩියා කිරීම. | 35.0 | 35.0 | | 15% |
| 03 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ 400m/200m කෘතිම ධාවන පථය ප්‍රතිසංස්කරණය කිරීම. | 30.0 | 30.0 | | 2% |
| 04 | ක්‍රීඩා බැංකු ව්‍යාපෘතිය. | - | - | | - |
| 05 | CCTV කැමරා පද්ධතිය සහ මාධ්‍ය ඒකකය ස්ථාපනය කිරීම | 10.0 | 10.0 | | - |
| 06 | ක්‍රීඩා හෝටල් මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීම. | 23.0 | 23.0 | | 25% |
| 07 | ගෘහස්ථ ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | 15.0 | 15.0 | | 10% |
| 08 | එළිමහන් ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | 10.0 | 10.0 | | 10% |
| 09 | බෝගම්බර ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම | 10.0 | 10.0 | | - |
| 10 | අවිච්ඡේද ව්‍යාපෘති | 117.5 | 60.5 | 26.29 | 78% |
| | | **290.5** | **233.5** | **26.29** | |

**2024 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

| | ව්‍යාපෘතියේ විස්තරය | ව්‍යාපෘති වටිනාකම (රු මිලි) |
|---|---|---|
| 01 | එළිමහන් ක්‍රීඩාංගණයේ මාධ්‍ය ගොඩනැගිල්ල හා ප්‍රේක්ෂකාගාරයේ වහල නවීකරණය කිරීම. | 54.00 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩා හෝටලයේ ජල කාන්දුව නවීකරණය. | 37.00 |

| | | |
|---|---|---|
| 03 | පිහිනුම් තටාක ප්‍රේක්ෂකාගාරයේ පුටු අලුතින් මිලදී ගෙන සවි කිරීම. | 24.00 |
| 04 | එළිමහන් ක්‍රීඩාංගනය සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීම. | 9.30 |
| 05 | බෝගම්බර ක්‍රීඩාංගනය නවීකරණය. | 28.00 |
| 06 | එළිමහන් ක්‍රීඩාංගණය වටා ඇති වැට අලුත්වැඩියාව. | 18.00 |
| 07 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ගිනි නිවීමේ පද්ධතිය නවීකරණය | 14.50 |
| 08 | 'CCTV' කැමරා පද්ධතිය නවීකරණය කිරීම. | 2.00 |
| 09 | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම. | 9.50 |
| 10 | අවිච්ඡේද ව්‍යාපෘති. | 84.00 |
| 11 | බෝගම්බර ක්‍රීඩාංගනයේ රථගාල නවීකරණය. | 18.00 |
| 12 | දුනු ශිල්ප පරාසය ඉදිකිරීම. | 2.00 |
| 13 | ක්‍රීඩා හෝටලයේ මුලුතැන්ගෙය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම. | 9.50 |
| 14 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ සිවිලිම අළුත්වැඩියා කිරීම. | 9.50 |
| | | **319.30** |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයට කරන ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය**

**01. වාර්තාකරණ ආයතනය**

**1.1 නෛතිකමය හා ස්ථිර ලියාපදිංචි පිහිටීම**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය 1999 අංක 17 දරන පනතෙන් සංස්ථාගත කර ඇත. ප්‍රධාන ගොඩනැගිල්ල නො. 2211, ආතර් ද සිල්වා මාවත, කොළඹ 13 හි පිහිටා ඇත.

**1.2 මූල්‍ය ප්‍රකාශනයන්හි අනුමැතිය**

2023 පෙබරවාරි 20 වන දින කළමනාකරණ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

**1.3 වාර්තා කිරීමේ කාල සීමාව**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය කාල සීමාව 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වේ.

**02. පදනම් පිළියෙල කිරීම හා වෙනත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනය රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

**2.1.1 අනුකූලතා ප්‍රකාශය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනය රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් යටතේ පිළියෙල කර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සටහනින් සමන්විත වේ.

### 2.1.2 ප්‍රවර්තන ව්‍යාපාරය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සහ ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස එය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර නුදුරු අනාගතය සඳහා ආයතනය තුළ අඛණ්ඩව පවත්වාගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳ සුවිශේෂී සැකයක් ඇති කළ හැකි භෞතික අවිනිශ්චිතතා පිළිබඳව කළමනාකරණ මණ්ඩලය දැනුවත් නැත.

ඒ මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ප්‍රවර්තන ව්‍යාපාර පදනම මත ය.

### 2.1.3 මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දිනට පසු සිද්ධීන්

වාර්තා කිරීමේ දිනට පසුව සිදුවූ සියලුම වැදගත් සිද්ධීන් පිළිබඳ සලකා බලා ඇති අතර අවශ්‍ය ඕනෑම තැනක සුදුසු ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයේ සිදු කර ඇත.

### 2.1.4 මූල්‍යමය හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත අයිතමය මනිනු ලබන්නේ, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය මෙහෙය වූ මූලික ආර්ථික පරිසරයේ මුදල් (ක්‍රියාකාරී මුදල්) භාවිත කරමිනි. මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන්නේ, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන "ශ්‍රී ලංකා රුපියල් (රු)" වලිනි.

### 2.1.5 වැටයීම

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියෙන් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් මුදල් ආසන්න රුපියලට වැටයීම සිදු කර ඇත.

## 03. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 3.1.1 දේපල, පිරියත හා උපකරණ

### 3.1.2 හඳුනාගැනීම සහ මැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතම පිරිවැය අවම සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අලාභ හානිවලින් ප්‍රකාශ කෙරේ. කළමනාකරණය විසින් අදහස් කරන අයුරින් වත්කම මෙහෙයවිය හැකි ආකාරයට අවශ්‍ය ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම්, ඓතිහාසික පිරිවැයට ඇතුළත් වේ. භෞතික පිරිවැය සහ සෘජු ශ්‍රමය ස්වයං උත්පාදන වත්කම්වලට ඇතුළත් වේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් කාල පරිච්ඡේදයන් ඇති ප්‍රධාන කොටස්වලින් සමන්විත වන විට, ඒවා දේපල, පිරියත සහ උපකරණයන්හි වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

### 3.1.3 පසුකාලීන වියදම්

ප්‍රතිස්ථාපන කරන ලද කොටස මගින් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට වර්ධක අනාගත ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කරන්නේ නම්, එම පිරිවැය දැරීමට සිදු වූ විට සමාගම විසින් දේපලක, පිරියතක සහ උපකරණ ධාරක මුදල එම භාණ්ඩයේ කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයට එකතු කරයි.

ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරක මුදල පිළිනොගනු ලබයි. අනෙකුත් සියලුම

අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඒවා දරනු ලබන කාල සීමාව තුළ ලාභ හෝ අලාභ සඳහා අය කර ගැනේ.

### 3.1.4 ක්ෂය

සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් ලාභයට හෝ අලාභයට ක්ෂය අය කර ගැනෙන්නේ, වත්කම්වල පිරිවැය ඒවායේ අවශේෂ වටිනාකමින් අඩු කර දේපල, පිරියත සහ උපකරණ අයිතමවල ඇස්තමේන්තුගත ඵලදායී කාල පරිච්ඡේදයෙන් බෙදීමෙනි. ඇස්තමේන්තුගත වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2.5% |
| පතිත විදුලි අලෝක කුළුණු | 10% |
| කෘත්‍රිම ධාවන පථය | 20% |
| පිරියත, යන්ත්‍රෝපකරණ | 10% |
| මෝටර් වාහන | 20% |
| ක්‍රීඩා උපකරණ | 10% |
| ගෘහ භාණ්ඩ හා උපාංග | 10% |
| කාර්යාලයීය උපකරණ | 10% |
| පරිගණක උපාංග හා මෘදුකාංග | 25% |
| රෙදිපිළි | 50% |
| පතිත විදුලි ආලෝක පහන් සහ ජ්වලක | 33 1/3% |

වත්කමක් මිල දී ගත් දිනයේ සිට ක්ෂය අය කර ගනු ලබයි.

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතයට ගැනීමට ඇති විට සහ වත්කම විකිණීමට තබා ඇති දිනයට පෙර නතර කළ විට සහ වත්කම පිළිනොගත් දිනයට ය.

වත්කම්වල අවශේෂ අගයන්, ඵලදායී කාල පරිච්ඡේදය සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කර, අවසානයට වාර්තා කළ දින සිට සුවිශේෂී වෙනසකමක් දක්නට තිබේ නම් යෝග්‍ය වන්නේ නම් අපේක්ෂිත පරිදි ගැළපීම් සිදු කරනු ලැබේ.

බැහැර කිරීමේ දී, ශුද්ධ බැහැර කිරීමෙන් ලත් මුදල් සහ විකුණන ලද අයිතමයේ ධාරක මුදල අතර වෙනස ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන "වෙනත් ආදායම්" හෝ "වෙනත් මෙහෙයුම් වියදම්වලට ඇතුළත් කර ගැනේ.

## 3.2 සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

වර්ෂය තුළ දී සම්පූර්ණ කර භාවිතයට ගන්නා ලද ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත සහ උපකරණවලට මාරු කරනු ලැබුව ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නිකුත් කරන දිනට වර්ෂය තුළ සම්පූර්ණ නොකළ දරන ලද ප්‍රාග්ධන වියදම් සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයක් ලෙස පෙන්වනු ලබයි.

## 3.3 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනයෙන් පසු වසරක් ඇතුළත අයකර ගන්නා ඒවා ශේෂ පත්‍රයේ වර්ගීකරණය කොට දක්වා ඇති ජංගම වත්කම් වේ.

### 3.3.1 භාණ්ඩ ලේඛන සහ තොග

භාණ්ඩ ලේඛන මනිනු ලබන්නේ අවම පිරිවැයකින් සහ ශුද්ධ නිදහස් කළ හැකි අගයකිනි. භාණ්ඩ ලේඛනවල පිරිවැය හරිත මධ්‍යන්‍ය මූලධර්මයක් මත පදනම් වන අතර භාණ්ඩ ලේඛන අත්පත් කර ගැනීමේ දී සහ ඒවායේ පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදම් ඇතුළත් වේ.

ශුද්ධ උපලබ්ධි අගය යනු සමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් සම්පූර්ණ කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් වියදම් අඩුකළ පසු ලැබෙන අගයයි.

භාණ්ඩ ලේඛන ප්‍රධාන වශයෙන් නඩත්තුව සඳහා භාවිත කරන භෞතික ද්‍රව්‍යවලින් සමන්විත වේ. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ භාණ්ඩ ලේඛන, පිරිවැයෙන් පෙන්වා ඇති අතර පිරිවැය භාණ්ඩ ලේඛනවල ශුද්ධ නිදහස් කළ හැකි වටිනාකමට සමාන වේ.

### 3.3.2 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් ලෙස, ප්‍රතීත මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් ලෙස හා වටිනාකමින් අය කිරීමේ දී නොසැලකිය යුතු අවදානමකට යටත් වන මුදල් ලෙස නිර්වචනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සඳහා, අතැති මුදල් සහ බැංකු තැන්පතුවලින් මුදල් සමාන දෑ සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය මත පදනම්ව වාර්තා කෙරේ.

### 3.3.3 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

ලැබිය යුතු ගිණුම් උපලබ්ධි කර ගැනීමට ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණයෙන් දක්වා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී, බොල් හා අඩමාණ ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත.

### 3.3.4 බොල් ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය ප්‍රතිපාදන සඳහා පහත ප්‍රතිශත යොදා ගනු ලැබේ.

| | |
|---|---|
| රාජ්‍ය ආයතන<br>හිඟ මුදල් | |
| මාසයේ සිට මාස 03 දක්වා | 10% |
| මාස 03 සිට මාස 06 දක්වා | 20% |
| මාස 06 සිට මාස 12 දක්වා | 40% |
| වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා | 50% |
| වර්ෂ 03 සිට වර්ෂ 06 දක්වා | 70% |
| වර්ෂ 06 සිට වර්ෂ 10 දක්වා | 80% |
| වර්ෂ 10කට වඩා වැඩි | 100% |
| සම්මේලන | |
| හිඟ මුදල් | |
| මාසයේ සිට මාස 03 දක්වා | 10% |
| මාස 03 සිට මාස 06 දක්වා | 20% |
| මාස 06 සිට මාස 09 දක්වා | 40% |
| මාස 09 සිට වර්ෂයක් දක්වා | 60% |

| | |
|---|---|
| වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා | 80% |
| වර්ෂ 03කට වඩා වැඩි | 100% |
| හිඟ මුදල් | |
| මාසයේ සිට මාස 03 දක්වා | 25% |
| මාස 03 සිට මාස 06 දක්වා | 45% |
| මාස 06 සිට මාස 09 දක්වා | 65% |
| මාස 09 සිට වර්ෂයක් දක්වා | 85% |
| වර්ෂයකට වඩා වැඩි | 100% |

## 3.4 වගකීම් ප්‍රතිපාදන

### 3.4.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය පිළියෙල කළ දිනයේ සිට වසරක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවිය යුතු වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ප්‍රතීත සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

### 3.4.2. විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

සමාගමට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායක සැලසුම් යන ද්විත්වයම ඇත. නිශ්චිත දායක සැලැස්මක් යනු අධිකාරිය යටතේ ඇති වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ වත්මන් සහ පූර්ව කාල පරිච්ඡේදයන්හි සේවා නියුක්තික සේවයට අදාළ සියලුම සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොමැති නම්, දායක මුදල් ගෙවීමට තවදුරටත් නෛතික හෝ සාධනීය බැඳීමක් නොමැති විශ්‍රාම වැටුප් සැලැස්මක් වේ. නියම නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් යනු වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු විශ්‍රාම යාමේ දී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මුදලක් වේ.

**(a) නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ**
**- සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF)**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ආදී දායක මුදල් සඳහා හිමිකම් ලබන සියලුම සේවකයන් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ.

**(b) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත වගකීම් යටතේ දක්වා ඇති අයිතමය සහ සේවකයාගේ සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව සේවකයකුට වගකීමක් පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීම මත පමණි. පාරිතෝෂිකයට බාහිරින් අරමුදල් සපයන්නේ නැත.

### 3.4.3. අසම්භාව්‍ය වගකීම්

අධිකාරියේ අසම්භාව්‍ය වගකීම් අදාළ මූල්‍ය ප්‍රකාශන සටහන්වල අනාවරණය කර ඇත.

## 4.0 හිමිකම්

### 4.4.1 ප්‍රදාන

රජයේ ප්‍රදාන පිළිගනු ලබන්නේ, ප්‍රදානය ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ බැඳී ඇති සියලුම කොන්දේසිවලට අනුකූලව වේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වනවිට එය වන්දි ගෙවීමට අපේක්ෂිත වියදම්, වියදම් දරන කාල සීමාවන් තුළ ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වනවිට එය අදාල වත්කමේ අපේක්ෂිත ඵලදායී කාලපරිච්ඡේදයට වඩා සමාන මුදලක ආදායමක් ලෙස පිළිගැනේ.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට මූල්‍යමය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම සහ ප්‍රදානය නාමික මුදල්වලින් දළ වශයෙන් සටහන් කරගනු ලබන අතර පාදක වන වත්කමේ ප්‍රතිලාභයෙහි පරිභෝජන රටාවකින් අපේක්ෂිත ඵලදායී කාලපරිච්ඡේදයට ඉහළින් වූ ලාභයට හෝ අලාභයට සමාන වාර්ෂික වාරිකයකින් නිදහස් කරනු ලැබේ. දැනට පවතින වෙළඳපල අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයකින් රජය හෝ ඒ හා සම්බන්ධ ආයතන විසින් ණය හෝ ඒ හා සමාන ආධාර සපයන විට, මෙම වාසිදායක පොලියේ බලපෑම රජයේ ප්‍රදානයක් ලෙස සැලකේ.

## 4.5 ආදායම් බදු වියදම්

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට (ආදායම් බදු) අනුව, බදු වියදම යනු ජංගම සහ විලම්බිත බදු සම්බන්ධ කාල සීමාව සඳහා වූ ලාභය හෝ අලාභය නිර්ණය කිරීමේ දී ඇතුළත් කරගන්නා ලද සමස්ත මුදලයි. "හිමිකම්" හෝ "වෙනත් විස්තීර්ණ ආදායම් (OCI)" හි සෘජුවම පිළිගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට හැර එය හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) වලින් පිළිගනු ලැබ ඇති අවස්ථාවක දී ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගනු ලැබේ.

### ජංගම බදුකරණය

ජංගම බදු වත්කම් සහ වගකීම් වත්මන් වර්ෂයට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්ගෙන් හා පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදුවලට කරන ලද යම් ගැලපීමකින් සමන්විත වේ. මුදල් ගණනය කිරීම සඳහා භාවිත කරනු ලබන බදු අනුපාත සහ බදු නීති, වාර්තා කරන දිනයෙන් පනවනු ලබන හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලබන ඒවා වේ. ඒ අනුව, බදු අයකර ගැනීම සඳහා වන ප්‍රතිපාදන පදනම් වන්නේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ සංශෝධන යටතේ බදු අයකර ගැනීමේ අරමුණු සඳහා ගැළපීම් සිදු කරන ලද වර්ෂය සඳහා වූ ලාභය මත වේ.

2022 ජූනි 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් නිකුත් කරන ලද සමාජ ආරක්ෂණ බදු පනතට අනුව, එම බද්දට 2022 ඔක්තෝම්බර් මාසයේ සිට අධිකාරිය යටත් වේ. බදු වියදම අධිකාරිය විසින් දරනු ලැබේ.

### විලම්බිත බදු වත්කම් (වගකීම්)

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරක මුදල් අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ දී වූ තාවකාලික වෙනස්කම් මත විලම්බිත බද්ද ලබා දෙනු ලැබේ.

විලම්බිත බදු වගකීම් බදු ගෙවිය හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා පිළිගනු ලැබේ, පහත දෑ හැර:

- සේවා සංයෝජනයක් නොවන ගණුදෙනුවක කීර්ති නාමය හෝ වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් විලම්බිත බදු වගකීම පැන නගින විට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගණනය කරනු ලබන ලාභයට හෝ බදු ගෙවිය හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

- තාවකාලික වෙනස්කම් ආපසු හැරවීමේ කාලය පාලනය කළ හැකි විට හවුල් ව්‍යාපාරවල පොලී අනුබද්ධිත ආයතනවල සහ සමාගම්වල ආයෝජන හා සම්බන්ධ බදු ගෙවිය හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් ඇතැම්විට තාවකාලික වෙනස්කම් නුදුරු අනාගතයේ දී ආපසු හැරවීමට නොහැකි වේ.

- විලම්බිත බදු වත්කම් සියලු අඩු කළ හැකි වෙනස්කම් සඳහා පිළිගනු ලැබේ. අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ, බදු ගෙවිය හැකි ලාභ ලබා ගත හැකි ප්‍රමාණයට ඉදිරියට ගෙන යාමට එරෙහිව අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය හා අභාවිත බදු අලාභ යොදා ගත හැකි වේ. පහත අවස්ථාවල දී හැර:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළ විලම්බිත බදු වත්කම සේවා සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කම් හෝ වගකීම් මූලික හඳුනාගැනීමෙන් පැන නගින අතර ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු කළ හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

- අනුබද්ධිත ආයතනවල සහ සාමාගම්වල විලම්බිත බදු වත්කම්වල ආයෝජන හා සම්බන්ධ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් හඳුනාගනු ලබන්නේ, තාවකාලික වෙනස්කම් අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතයේ දී ආපසු හැරවීමට සහ තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

- විලම්බිත බදු වත්කමක ධාරක මුදල එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ දී සමාලෝචනය කෙරෙන අතර විලම්බිත බදු වත්කම්වලින් සම්පූර්ණ ප්‍රමාණය හෝ කොටසක් භාවිත කිරීමට ඉඩ දීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තවදුරටත් සිදුවී නොමැති තරමට එය අඩු කරනු ලැබේ.

- හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයක දී ම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් ආපසු ලබා ගැනීමට ඉඩ සලසන තරමට හඳුනා ගැනේ.

- බදු අලාභ විය හැකි ප්‍රමාණය සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගෙන ඇති අතර එවැනි බදු අලාභ යොදා ගත හැකි වන අනාගත බදු අය කළ හැකි ලාභ පවතිනු ඇත. අනාගත බදු සැලසුම් ක්‍රමෝපායන් සමඟින් අනාගත බදු අය කළ හැකි ලාභයේ සුදුසු කාලය සහ මට්ටම මත පදනම්ව හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ගණන තීරණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ.

- විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ දී පනවන ලද හෝ පසුව පනවන ලද බදු නීති හා බදු අනුපාත මත පදනම් ව වත්කම් උපලබ්ධි කරන ලද විට හා වගකීම් පියවූ විට වර්ෂයේ දී ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බදු අනුපාතයට අනුවය.

## 05. ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

### 5.1. ආදායම

සේවාවන් සම්පූර්ණ කර ඇති විට ආදායම ප්‍රධාන වශයෙන් උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

පාරිභෝගිකයෙකු සමඟ ඇති කරගත් ගිවිසුමක් මගින් ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නැති විට සහ ආයතනයක් පාරිභෝගිකයාගෙන් ප්‍රතිෂ්ඨාවක් ලද විට, ආයතනය විසින් ලද ප්‍රතිෂ්ඨාව ආදායම ලෙස හඳුනාගත යුත්තේ පහත සිදුවීම්වලින් එකක් සිදු වූ විට පමණි:

(අ) පාරිභෝගිකයා වෙත භාණ්ඩ හෝ සේවා පැවරීමට ආයතනයට බැඳීම් ඉතිරිව නොමැති අතර පාරිභෝගිකයා විසින් පොරොන්දු වූ ප්‍රතිෂ්ඨ වේ සියල්ල හෝ ප්‍රමාණවත් ලෙස සියල්ල ආයතනයට ලැබී ඇති අතර එය ආපසු ගෙවිය නොහැක; හෝ

(ආ) ගිවිසුම අවසන් කර ඇති අතර පාරිභෝගිකයාගෙන් ලද ප්‍රතිෂ්ඨාව ආපසු ගෙවිය නොහැක.ආදායම් හඳුනා ගැනීමේ ඉල්ලුම්පත්‍ර තක්සේරු කිරීමේ දී විනිශ්චයක් අවශ්‍ය වන අතර කොන්ත්‍රාත්තුව අවසන් වීමෙන් පසු වසර දෙකකට වඩා වූ ආපසු ගෙවිය හැකි තැන්පතු ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

### 5.2. වියදම්

ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන පරිදි බදු ගෙවීමට පෙර අධිකාරිය විසින් උපයන ලද හෝ දරන ලද ලාභය හෝ අලාභය වන්නේ, සියලු ප්‍රතීත වගකීම් සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුවය.

ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට ඒමේ දී ආදායමට අයකර ගෙන ඇත.

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ දී ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත.

#### 5.2.1. මූල්‍ය පිරිවැය

ණයට ගැනුම් සම්බන්ධයෙන් දරනු ලබන සියලුම පොලී සහ අනෙකුත් වියදම් මූල්‍ය පිරිවැයේ කොටසක් ලෙස දරන වියදම් වේ.

## 06. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහය “වක්‍ර ක්‍රමය” භාවිත කරමින් පිළියෙල කර ඇත.ගෙවන ලද පොලිය මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කෙරේ. ලද පොලී සහ ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කෙරේ.ලද පොලී සහ ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ගෙවන ලද ලාභාංශ වත්මන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කෙරේ.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන**
**මූල්‍ය ප්‍රකාශ සටහන්**

**අසම්භාව්‍ය බැරකම්**
**නඩු අංක 2184 / M / 2015 නුගේගොඩ දිසා අධිකරණය**

සුගතදාස අධිකාරියේ හිටපු සභාපති බ්‍රිගේඩියර් විමල් සමරතුංග 2013 වර්ෂයේ දී සුගතදාස අධිකාරියට අයත් රාජකාරී වාහනයක් පදවමින් යන අතරතුර දී අනතුරකට ලක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජයන් විශාකා ලියනගේ නමින් හඳුන්වන දරුවකු ජීවිතක්ෂයට පත්ව ඇත. විත්තිකරුවන්ගෙන් වන්දි ලබා ගැනීමේ අරමුණින් මෙම නඩුව ඇගේ දෙමාපියන් විසින් ආරම්භ කර ඇත. බ්‍රිගේඩියර් විමල් සමරතුංග සහ සුගතදාස අධිකාරිය පිළිවෙළින් පළමුවන හා දෙවන විත්තිකරුවන් ලෙස නම් කර ඇත. රුපියල් 50,000,000.00ක මුදලක් එක්ව හා වෙන් වෙන්ව විත්තිකරුවන්ගෙන් අලාභ ලෙස ලබා ගැනීමට පැමිණිලිකරුවන් ආයාචනා කර සිටී.

2012 වර්ෂයේ දී ගහකොළ ලෑන්ඩ්ස්කේපින් සමාගම විසින් ඉදිකරන ලද සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400කින් යුත් කෘත්‍රිම ධාවන පථයේ අවිධිමත් ඉදිකිරීම නිසා අලාභ අයකර ගැනීම

2012 වර්ෂයේ දී ගහකොළ ලෑන්ඩ්ස්කේපින් සමාගම (කොන්ත්‍රාත්කරු) විසින් ඉදිකරන ලද ඉහත සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400කින් යුත් කෘත්‍රිම ධාවන පථය අවිධිමත් ඉදිකිරීමක් වීම හේතුවෙන් වගකීම් කාලසීමාව ඇතුළත පළුදු වී හා දුර්වර්ණ වී ඇති අතර භාවිත කළ නොහැකි තත්ත්වයට පත්ව ඇත. මෙයින් වූ අලාභය රු.124,967,171.90ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම අලාභය අයකර ගැනීම සඳහා ආර්. ඒ. පී. රෝහණ මහතා විනිශ්චයකාරවරයා ලෙස පත් කර "ගහකොළ ලෑන්ඩ්ස්කේපින් සමාගමට" එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ පළමු පියවර ලෙස, ආරවුල මේ වනවිට විනිශ්චයට යොමු කර ඇති අතර විනිශ්චය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

**28/2020 DLM කොළඹ දිසා අධිකරණය**

මෙම නඩුව එස්. විජයකුමාර් නමැත්තා විසින් සුගතදාස ජාතික ක්‍රීඩාංගණ අධිකාරියට එරෙහිව ගොනු කරන ලදී. මෙම නඩුවේ දී ඔහුට නීත්‍යනුකූලව අයත් ඉඩම් කොටසක් සුගතදාස ජාතික ක්‍රීඩාංගණ අධිකාරිය විසින් බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති බවත්, එකී ඉඩම් කොටසේ නීත්‍යනුකූල හිමිකරු තමන් බවත්, එහි සාමකාමී භුක්තිය තමන්ට ලබා දී ඇති බවත් ප්‍රකාශ කර සිටියි. තවද, ඔහු හිමිකම් කියනු ලබන ඉඩම අනවසරයෙන් අත්පත් කර ගැනීම හේතුවෙන් සිදු වූ පාඩුව වෙනුවෙන් 2018 සිට මසකට රු. 500,000 ක වන්දියක් ඉල්ලා සිටියි. කෙසේ වෙතත්, පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය උත්තරවාදය ගොනු කර ඇත.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන**
**මූල්‍ය ප්‍රකාශ සටහන්**

2023 වර්ෂය සඳහා වන අවසාන ගිණුම් සැකසීමේ දී, 2022 වර්ෂය සඳහා නැවත ප්‍රකාශිත සංඛ්‍යා තුලනාත්මක සංඛ්‍යා ලෙස දැක්වේ.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | **රු.** | **රු.** |
|---|---:|---:|
| අතිරික්ත/ (හිඟ) | (20,555,683) | (95,540,272) |
| | | |
| මූල්‍ය නොවන සංචලන | | |
| | | |
| ක්‍රමක්ෂය සඳහා ගැළපීම් | (115,798,229) | (114,373,582) |
| ක්ෂය සඳහා ගැළපීම | 115,770,929 | 117,580,242 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 2,267,623 | 883,787 |
| විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 28,899,185 | 4,380,690 |
| භාණ්ඩ ලේඛනයෙන් අඩුවීම්/ (වැඩිවීම්) | 2,280,845 | (2,445,690) |
| ලැබිය යුතු දෑ වල අඩුවීම්/ (වැඩිවීම්) | (4,499,479) | 5,681,764 |
| ගෙවිය යුතු දෑ වල (අඩුවීම්)/ වැඩිවීම් | (7,300,736) | 51,572,557 |
| ගෙවන ලද පාරිතෝෂික | (9,085,363) | (2,987,165) |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | (8,020,909) | (35,247,669) |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| දේපල, පිරියත සහ උපකරණ මිල දී ගැනීම් | (10,050,810) | (52,882,629) |
| ස්ථාවර තැන්පතුවලින් ලද ආයෝජන | (3,081,779) | (2,435,273) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | (13,132,589) | (55,317,902) |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| පෙර වර්ෂයේ ගැළපීම් | | (3,063,156) |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් | 54,946,882 | 14,129,720 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | 54,946,882 | 11,066,564 |
| | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | 33,793,384 | (79,499,007) |
| වසර ආරම්භයේ මුදල් හා බැංකු සමාන දෑ | 12,156,700 | 91,655,709 |
| | | |
| වසර අවසානයේ මුදල් හා බැංකු සමාන දෑ | 45,950,083 | 12,156,700 |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ආදායම් වියදම් ප්‍රකාශය**

| | රු. 2023.12.31 | රු. 2022.12.31 නැවත ප්‍රකාශිත | රු. අයවැය ප්‍රතිපාදන 2023 |
|---|---|---|---|
| ආදායම් | | | |
| මෙහෙයුම් ආදායම් | 237,666,762 | 105,651,600 | 138,483,389 |
| මෙහෙයුම් නොවන ආදායම් | 1,224,832 | 1,531,007 | 1,607,557 |
| | 238,891,594 | 107,182,607 | 140,090,946 |
| ආදායම් ප්‍රදාන | | | |
| රජයේ ප්‍රදානයන් | 136,764,118 | 128,830,280 | 314,980,000 |
| ක්‍රමක්ෂය ගිණුම | 115,798,229 | 114,373,582 | - |
| | 252,562,347 | 243,203,862 | 314,980,000 |
| මුළු ආදායම් | 491,453,941 | 350,386,469 | 455,070,946 |
| වියදම් | | | |
| මෙහෙයුම් වියදම් | | | |
| පුද්ගලික දීමනා | 194,434,237 | 197,454,646 | 230,700,000 |
| මණ්ඩලීය සාමාජික දීමනා | 349,500 | 423,000 | - |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන | 28,899,185 | 4,380,690 | - |
| ක්ෂය වීම් | 115,770,929 | 117,580,242 | - |
| වෙනත් පොදු කාර්ය වියදම් | 172,560,523 | 128,581,819 | 83,980,000 |
| මුළු වියදම් | 512,014,374 | 448,420,397 | 314,680,000 |
| මෙහෙයුම් අතිරික්තය | (20,560,433) | (98,033,928) | 140,390,946 |
| මූල්‍ය පිරිවැය | (6,111,471) | (1,025,916) | (300,000) |
| බදු අයකිරීමට පෙර වර්ෂය සඳහා අතිරික්තය (හිඟ) | (26,671,903) | (99,059,844) | 140,090,946 |
| එකතු කළා: මෙහෙයුම් නොවන ආදායම | | | |
| ස්ථාවර තුන්පතු පොලී ආදායම | 6,116,220 | 3,519,572 | - |
| වර්ෂය සඳහා බදු අයකිරීමට පෙර ශුද්ධ හිඟය | (20,555,683) | (95,540,272) | 140,090,946 |
| වර්ෂය සඳහා බදු අය කිරීමෙන් පසු ශුද්ධ හිඟය | (20,555,683) | (95,540,272) | 140,090,946 |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ශේෂ පත්‍රය**

| | රු. 2023 දෙසැම්බර් 31 | රු. 2022 දෙසැම්බර් 31 නැවත ප්‍රකාශිත |
|---|---:|---:|
| වත්කම් | | |
| ජංගම වත්කම් | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 45,950,083 | 12,156,700 |
| ලැබිය යුතු වාණිජ දෑ | 5,640,844 | 5,513,005 |
| භාණ්ඩ ලේඛන | 8,781,561 | 11,062,406 |
| කාර්ය මණ්ඩල දස මාසික ණය | 24,030,835 | 24,861,154 |
| වෙනත් ලැබිය යුතු දෑ | 27,923,282 | 25,134,863 |
| පාරිතෝෂික අරමුදල | 5,797,435 | 5,651,517 |
| ස්ථාවර තැන්පතු | 55,024,681 | 51,942,902 |
| | 173,148,721 | 136,322,547 |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් | 2,856,612,140 | 2,856,612,140 |
| ගොඩනැගිලි | 2,089,830,930 | 2,170,969,492 |
| පතිත විදුලි ආලෝක පහන් | 104,368 | 29,222 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 15,763,127 | 27,821,400 |
| පරිගණක උපාංග හා මෘදුකාංග | 705,732 | 925,316 |
| මෝටර් වාහන | 688,129 | 2,761,717 |
| ක්‍රීඩා උපකරණ | 55,605,990 | 65,054,960 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 31,092,583 | 39,174,782 |
| උපකරණ (කාර්යාල හා වෙනත්) | 4,219,512 | 4,854,557 |
| රෙදිපිළි | 68,570 | - |
| නොනිමි කාර්යයන් | 201,827,713 | 194,035,328 |
| | 5,256,518,795 | 5,362,238,914 |
| මුළු වත්කම් | 5,429,667,516 | 5,498,561,461 |
| හිමිකම් හා වගකීම් | | |
| වගකීම් | | |
| ජංගම වගකීම් | | |
| ගෙවිය යුතු වාණිජ දෑ | 19,305,709 | 34,045,181 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 20,073,838 | 12,351,925 |
| උපලබ්ධි නොවූ ආදායම් | 287,500 | 250,000 |
| බදු ප්‍රතිපාදන | - | 35,000 |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු උපචිත හා මුදල් | 24,485,743 | 23,570,870 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 124,887,737 | 126,088,288 |
| | 189,040,527 | 196,341,264 |
| ජංගම නොවන වගකීම් | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 109,088,683 | 89,274,860 |
| | 109,088,683 | 89,274,860 |
| මුළු වගකීම් | 298,129,209 | 285,616,124 |
| ශුද්ධ වත්කම් | 5,131,538,307 | 5,212,945,337 |
| ශුද්ධ වත්කම්/ හිමිකම් | | |
| රජයේ ප්‍රදානයන් | 5,289,784,034 | 5,350,635,381 |
| සමුච්චිත අතිරික්තය | (147,024,694) | (51,484,424) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 9,334,652 | 9,334,652 |
| වසර සඳහා අතිරික්ත/ (හිඟ) | (20,555,683) | (95,540,272) |
| මුළු ශුද්ධ වත්කම්/ හිමිකම් | 5,131,538,307 | 5,212,945,337 |

**ක්‍රීඩාංගණ අනුව ආදායම - 2023**

| ක්‍රීඩාංගණය | මෙහෙයුම් අදායම | මෙහෙයුම් නොවන ආදායම |
|---|---|---|
| සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය | 149,368,030.00 | - |
| සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය | 53,342,979.00 | - |
| ආර් ප්‍රේමදාස ක්‍රීඩාංගණය | 2,902,174.00 | - |
| බෝගම්බර ක්‍රීඩාංගණය | 24,172,028.00 | - |
| බෙලිඅත්ත පිහිණුම් තටාකය | 1,370,049.00 | - |
| නුවරඑළිය තුරඟතරඟ පිටිය | 6,511,500.00 | - |
| මෙහෙයුම් නොවන ආදායම් | | 1,531,007.00 |
| **මුළු ආදායම** | **237,666,760.00** | **1,531,007.00** |

**ආයතනයේ සමස්ත ප්‍රගතිය**

2012 වර්ෂයේ සිට 2023 වර්ෂය තෙක් ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත.

| වර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 89.03 | 134.61 | 99.62 | 82.51 | 100.29 | 125.34 | 169.04 | 50.86 | 53.94 | 107.18 | 239.19 |




**ආයතනයේ මුළු ණය**

2012 වර්ෂයේ සිට 2023 වර්ෂය තෙක් ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

| වර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ණය | 41.00 | 45.00 | 44.00 | 43.70 | 40.254 | 39.995 | 26.819 | 25.22 | 0.895 | 34.50 | 282.61 |



# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SYA/C/SNSCA/01/23/03 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 සැප්තැම්බර් 11 දින |

26 SEP 2024

සභාපති
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

විගණකාධිපති විසින් අත්සන් කරන ලද යථෝක්ත වාර්තාව සහ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් මේ සමඟ එවා ඇත.

එස්.එම්.එන් තිලකරත්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්:

1. ලේකම් - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
3. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SYA/C/SNSCA/01/23/03  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2024 සැප්තැම්බර් 11 දින

සභාපති
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ (''අධිකාරිය'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් හා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු.මිලියන 202.8 ක ඉදිකිරීම් වල වැඩ නිමකර භාවිතයට ගෙන තිබූ රු. මිලියන 164.9 ක ඉදිකිරීම්, ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 2,856.6 වූ ඉඩම් සම්බන්ධයෙන් හා රු. මිලියන 8.8 ක් වූ තොග සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන, වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු සහ තොග සත්‍යාපනය වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ඉඩම් වල හා තොගයේ වටිනාකමේ, නිරවද්‍යතාවය හා භෞතික පැවැත්ම පිළිබඳව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) ඉදිරි වර්ෂය සඳහා ලැබුණ රු. මිලියන 3.6 ක සාමාජික ගාස්තු සහ ක්‍රීඩාගාර වෙන් කිරීමේ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබීම නිසා එම ප්‍රමාණයෙන් ආදායම වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු. මිලියන 7,250 ක් වූ දේපල, පිරියත හා උපකරණ එසේ සමාලෝචනය කර නොතිබුණු අතර මුලුමනින්ම ක්ෂය වී තිබූ රු. මිලියන 747.8ක් වටිනා දේපල , පිරියත හා උපකරණ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ද නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි අසම්භාව්‍ය වත්කම් හා බැරකම් ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරයට එරෙහිව සහ අධිකාරිය විසින් ගෙන තිබූ නීතිමය ක්‍රියාමාර්ග 02ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

## 1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරිය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරිය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත්.හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

3

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තතත්වාගණනය කල මතය සඳහා වන ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරිය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ), (ඇ), (ඈ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරිය පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර,** යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකායේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීති,රීති / විධානයට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය | රජයේ නීතිගත සංස්ථාවක කිසිදු මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද අධිකාරිය විසින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය අවසානයේ රු. මිලියන 55 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| I. 371(2) හා 371(4) | ප්‍රවර්තන වර්ෂයේ අවස්ථා 23 ක දී ලබාදුන් රු. 854,635 ක තත්කාර්ය අතුරු අග්‍රිම වලට අදාල වියදම රු.428,255ක් විය. ඒ අනුව ලබාගත් අත්තිකාරම් වලින් මුළු මුදලම හෝ සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් මුදලින්ම ආපසු පියවා තිබූ අතර එම මුදල් පියවීමේදී දින 11 ක සිට දින 41 ක් දක්වා ප්‍රමාදයක් සිදු වී තිබුණි |
| II. 880 හා 891 (1) | මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් ද පවත්වාගෙන ගොස් නොතිබුණි. |

4

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ චක්‍රලේඛයෙන් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත් පොත සහ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය

| | | |
|---|---|---|
| I. | 2.3 මාර්ගෝපදේශය | අධිකාරියේ අරමුණු ශාක්සාත් කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව තුල වූ උපාය මාර්ගික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| II. | 5 මාර්ගෝපදේශය | අධිකාරිය විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඒවා ඇගයීම් කර ඉන් ඉටුකරගත් ප්‍රමාණය කොපමණද යන්න සමාලෝචනය කර නොතිබුණි. |
| III. | මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2024 මැයි 30 දින එනම් මාස 03 ක ප්‍රමාදයකින් පසුවය. |
| IV. | මෙහෙයුම් අත්පොතේ 3.1.2 ඡේදය | අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 29 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටිය විගණිත දින වන විටත් පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රඳවුම් මුදල් ශේෂ එකතුව රු. මිලියන 83.3 ක් වූ අතර, ඉන් රු. මිලියන 18 ක් , රු. මිලියන 50 ක් සහ රු. මිලියන 15 ක ශේෂයන් පිළිවෙළින් වර්ෂ 1 - 5 ක් අතර, වර්ෂ 5 -10 ක් අතර සහ වර්ෂ 10 ට වැඩි කාලයක සිට නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. එමෙන්ම මෙම ශේෂයන් තුල ඉදිකිරීම් දෝෂ හේතුවෙන් ගෙවීම් සිදු නොකරන ලද රු. මිලියන 2ක ශේෂයක් ද පැවති අතර මෙම ශේෂයන් නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට විවිධ ආයතන හා පුද්ගලයන් 42 ගෙන් අයවිය යුතු රු. මිලියන 32.4 ක ශේෂයක් පැවති අතර මෙම ශේෂය තුල වර්ෂ 3-5 ක් අතර සහ වර්ෂ 5 ට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින පිළිවෙලින් රු. මිලියන 7.6 ක් සහ රු. මිලියන 12 ක ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 398 ක මූලික ඇස්තමේන්තුවක් මත ප්‍රාග්ධන ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණද ප්‍රවර්ථන වර්ෂය තුල රු. මිලියන 26.3 ක් වැය කර ඉදිකර තිබුණේ එක් ව්‍යාපෘතියක් පමණි.

5

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමක රු. මිලියන 46 ක ශේෂයක් පැවති අතර වර්ෂයේ සෑම දිනකම අවසානයෙදි අවම වශයෙන් රු. මිලියන 18 ක සාමාන්‍ය ශේෂයක් කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන අක්‍රියව තබා ගැනිම හේතුවෙන් පවතින පොලි අනුපාතය අනුව අධිකාරියට උපයාගත හැකිව තිබූ රු. මිලියන 3 ක පොලී ආදායමක් අහිමි වි තිබුණි. මෙම ගිණුමේ ශේෂය අධිකාරියේ ප්‍රධාන කාර්යයන් සඳහා යොදවා ගැනීමට හෝ ඒවායින් උපරිම ප්‍රයෝජනය ලබාගැනීමට හෝ නිසි යාන්ත්‍රණයන් හඳුනා නොගැනීම හේතුවෙන් මෙම මුදල් අක්‍රියව පැවතුණි.

(ඉ) ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් වෙනුවෙන් රු. මිලියන 21ක අත්තිකාරම් 2017,2019 හා 2021 වර්ෂ වලදී ගෙවා තිබුණ අතර එම මුදල් 2022 වර්ෂයේදී පියවා ගත යුතුව තිබුණ ද, මෙම වාර්තාවේ දිනය දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරිය සතු ක්‍රීඩා හෝටලයේ නවාතැන් පහසුකම් ලබාදීමේදී එක් එක් පාර්ශවයන් වෙනුවෙන් විධිමත් ගාස්තු ක්‍රමයක් නිශ්චය කර ඒ අනුව ගාස්තු අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබීමෙන් හා අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන ගෘහස්ථ ක්‍රීඩාගාරය , ක්‍රීඩාංගණය හා පිහිණුම්තටාක වෙන් කර දීමේ දී පිරිවැයට සාපේක්ෂව ආදායම් විශ්ලේෂණයක් සිදුකර ගාස්තු නිශ්චය කර නොතිබීමෙන් හා හෝටලයේ පවතින මුළුතැන්ගෙය, රටබිම්හල හා භෝජනාගාරය ප්‍රයෝජනයට නොගෙන අක්‍රියව පැවතීම හේතුවෙන් ආදායම් රැස්කිරීම් අවිධිමත් පරිදි සිදු වී තිබූ අතර ආදායම් උපයාගැනීමට තිබූ අවස්ථාද අහිමි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

6

**2023 වර්ෂයේ අවසන් විගණන වාර්තාව සඳහා යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කිරීම**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා වු මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබදව 20218 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යොමුව SYA/C/SNSCA/01/23/03 2024.09.11 දිනැති ලිපිය හා සබැදේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සදහා පදනම**

**(අ.) පහත දක්වා ඇත.**

| අංක | ව්‍යාපෘතිය | වර්ෂය | මුදල | ව්‍යාපෘති තත්ත්වය |
|---|---|---|---|---|
| 1 | පාපන්දු ක්‍රීඩා පිටියේ අලුත් වැඩියාව | 2011 | 38,272,146.18 | ව්‍යාපෘතිය අවසන් කර ඇත, නමුත් දෝෂ ඇත. උපදේශක 50% වාරික ශේෂයට නිර්දේශ කර නැත. මණ්ඩලය ගෙවීමෙන් වැලකී ඇත. සම්පූර්ණ සහතිකය ඉදිරිපත් කර ඇත. |
